# කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

# පේරාදෙණිය විශ්වවිද්‍යාලය

## ශ්‍රී ලංකාව

# අධ්‍යක්ෂ තනතුර සඳහා අයදුම්පත් කැඳවීමයි

පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙහි කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පවතින අධ්‍යක්ෂක තනතුරු පුරප්පාඩුව සඳහා ශ්‍රී ලාංකීය පුරවැසියන් වෙතින් මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ.

අපේක්ෂිත අයදුම්කරුවන්, වයස අවුරුදු 63 ට අඩු විය යුතුවන අතර, පරිපාලනමය පළපුරුද්දක්ද සහිතව, කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාළ දර්ශනපති (Ph.D) ආචාර්ය උපාධියක්ද හිමි පශ්චාත් උපාධි සුදුසුකම් ලාභීන් විය යුතුය. සාර්ථක අපේක්ෂකයා ප්‍රජාව කෙරෙහි ආයතනයෙහි ඇති කැපවීම පිළිබඳ මනා අවබෝධයක්ද සහිත බහු විෂයික අධ්‍යයන (ශාස්ත්‍රාලීය) වාතාවරණයක රාජකාරී කටයුතු ඉටු කිරීම අවශ්‍ය වන අතර්ෂ අන්තර්- පුද්ගලමය කුසලතා හා දක්ෂතා සහිත විශ්වවිද්‍යාලය හා වෙනත් ජාතික හා ජාත්‍යන්තර ආයතන තුළ වෙනත් සංවිධාන හා සමග රාජකාරීමය වැඩකටයුතු කිරීමේ සබඳතා ස්ථාපනය කරන අතරම, ශාස්ත්‍රාලීය (අධ්‍යයන) කටයුතු සඳහා නායකත්වය සැපයීම පිළිබඳ වගකීම් භාරය දැරිය යුතු වන්නේය.

අධ්‍යක්ෂකවරයා / වරිය කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතන ආඥාපනත ප්‍රකාරව ආයතනයේ පූර්ණකාලීන සේවා නිලධාරියෙකු, මූලික ප්‍රධාන විධායක නිලධාරිවරයා / වරිය, මූලික / ප්‍රධාන අධ්‍යයන (ශාස්ත්‍රාලීය) නිලධාරිවරයා / වරිය හා ආයතනයේ ගිණුම්කරණ නිලධාරිවරයා / වරිය වනු ඇත. අධ්‍යක්ෂවරයා / වරිය කළමනාකරණ මණ්ඩලයේ සම්බන්ධීකරණ කමිටුවේ නිලබලයෙන් සාමාජිකයෙකු සහ සභාපති වනු ඇති අතර, ආයතනයේ අධ්‍යයන මණ්ඩල සෑම එකකම නිලබලයෙන් සාමාජිකයෙකුද වනු ඇත. පත්වීම්ලාභී අධ්‍යක්ෂකවරයා පත්වීම් ලද දින සිට හෝ වසර 65 සම්පූර්ණ වන දින දක්වා (පළමුවන දින / අවස්ථාව සිට / දක්වා) වසර 3 කාලසීමාවකට මෙම තනතුර හොබවනු ඇත.

ශ්‍රී ලංකාවේ, කෘෂිකර්මය පිළිබඳ, පශ්චාත් උපාධි අධ්‍යයනයන් සිදු කරන එකම ආයතනය වන කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින්, කෘෂිකර්මය පිළිබඳ බොහොමයක් විවිධ ක්ෂේත්‍ර සම්බන්ධයෙන්, පසුගිය වසර 45 ක් වන කාල පරිච්ඡේදය පුරා සීඝ්‍රයෙන් පැතිර ව්‍යාප්තව ඇති PGIA. ආයතනය විසින් රට තුළ ආර්ථික සංවර්ධනය ළඟාකර ගැනීම සඳහා මනා දායකත්වයක් සැපයීම වස්, කෘෂිකාර්මික අංශයේ, පෙර දකින ලද වෙනස්වීම් හා වෙනස්කම් අනුව යමින්, බොහෝ පැතිර යන බාහිර ක්‍රියාකාරකම් රැසකට අවතීර්ණ වී ඇති අතර, තවදුරටත් අධ්‍යයන / ශාස්ත්‍රාලීය වැඩසටහන් ව්‍යාප්ත කරමින් විවිධාංගීකරණයන් සිදු කිරීම සඳහා අපේක්ෂා දල්වා ඇත.

පාලක කළමනාකාරිත්ව මණ්ඩලය විසින්, මෙම අභියෝග ජයගැනීමට දෘෂ්ටි පථයක් සහිත පර්යේෂණ හා කළමනාකාරිත්වයන් පිළිබඳ අතර්ෂ හා විශිෂ්ට සේවා වාර්තාවක් සහිත මනා අධ්‍යයන (ශාස්ත්‍රාලීය) පසුබිමක් සහිත අයෙකු බඳවා ගැනීමට අදහස් කර ඇත.

අපේක්ෂිත අයදුම්කරුවන් විසින්, මෙම තනතුරට තමන් තෝරාගනු ලැබුවහොත් ඔහු / ඇය විසින් සාක්ෂාත් කර ගැනීමට යෝජනා කරනු ලබන කරුණු කාරණා පිළිබඳ ලුහුඬු විස්තරයක් හා ආයතනයේ සංවර්ධනය සඳහා වන දැක්ම (දෘෂ්ටිය) පිළිබඳ ප්‍රකාශයක් සහ සිය උපන් දිනය ඇතුළත් විස්තරාත්මක ජීව දත්ත තොරතුරු ප්‍රකාශයක් සමග, ස්වකීය අයදුම්පත් එවිය යුතුය. මෙම අයදුම්පත් කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යක්ෂක තනතුර"** යනුවෙන් පැහැදිලිව සටහන් කර **2020.10.28** වන දිනට හෝ ඊට පෙර ලැබෙනසේ **පේරාදෙණිය, පැරණි ගලහ පාරේ කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයෙහි නියෝජ්‍ය ලේඛකාධිකාරී** වෙත පෞද්ගලිකව ගෙනැවිත් භාරදීම හෝ ලේඛනගත තැපැලෙන් එවීම හෝ කළ යුතුය. අයදුම්පත සමග පේරාදෙණිය විශ්වවිද්‍යාලය හැර වෙනත් උසස් අධ්‍යාපන ආයතනයක් සහ ව්‍යවස්ථාපිත මණ්ඩල, රාජ්‍ය සංස්ථා හා රාජ්‍ය සේවයේ සේවාවන්හි දැනටමත් සේවයේ නියුතු අයදුම්කරුවන් තමන් මෙම තනතුරට තෝරාගනු ලැබුවහොත් දැනට දරන තනතුරින් මුදා හැරීමට හැකිද යන වග, සේවා යෝජකයා වෙතින් ලබාගත් ලිපියක්ද ඉදිරිපත් කළ යුතුය.

වැඩිදුර තොරතුරු විස්තර PGIA හි නියෝජ්‍ය ලේඛකාධිකාරී වෙතින් දුරකථන අංක 081-2388203 මගින් විමසීමෙන් හෝ ආයතනයේ වෙබ් අඩවිය වන (www.pgia.ac.lk) වෙත පිවිසීමෙන් හෝ ලබාගත හැකිය.

**නියෝජ්‍ය ලේඛකාධිකාරී,**
**කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය.**
**2020.10.07.**